# ශුන්‍යතාවෙන් නිර්ගුණ් බ්‍රහ්මන්ට

මිනිසුන් ඒ ඒ දේ නිර්මාණය කරන්නේ ම ඔවුන්ට නිර්මාණය නො කර සිටීමට නොහැකි නිසා ය. මේසය හෝ කන්ද හෝ නිර්මාණය කරන මිනිසාට මේසයක් හෝ කන්දක් හෝ නොමැති බව නො තේරෙයි. මිනිසා නිර්මාණය කරන්නේ ඒ නොතේරුම්කම නිසා ය. මිනිසා නිර්මාණය කරන ලෝකය ඒ අයුරින් නැත. එය වෙනත් අයුරකින් ද නැත. ලෝකය ශූන්‍ය යැ යි බුදුන්වහන්සේ වදාරා ඇත්තේ එබැවින් ය.

මනස ගැන තව දුරටත් සාකච්ඡා කිරම පසුවට කල්තබා අපි දැන් නැවතත් නාගර්ජුනපාදයන්ගේ ශූන්‍යතාවාදයට යමු. නාගර්ජුනපාදයෝ සංකල්ප එකිනෙකට සාපේක්ෂව ගත් හ. උන්වහන්සේගේ සාපේක්ෂතාවදය එක් නිරක්ෂකයකුට සාපේක්ෂ ව විරුද්ධාර්ථ දෙන සංකල්ප ගැනීම පිළිබඳ ව විය. එහි දී අඳුර ගැන යම් නිරක්ෂකයකුට තේරුම් ගත හැක්කේ එහි විරුද්ධ සංකල්පය වූ ආලෝකය ගැන ද දැනගැනීමෙන් බව පැවසිණි. එහෙත් ඇතැම් සංකල්පවලට විවිධ මානවල විරුද්ධ සංකල්ප ඇති බව අපි දුටුවෙමු. උදාහරණයක් ලෙස ගත හොත් පියා යන සංකල්පයෙහි විරුද්ධ සංකල්ප ලෙස මව මෙන් ම පුතා යන්න ද ගත හැකි ය. ඒ සංකල්ප පියා යන සංකල්පයට විරුද්ධ වන්නේ මාන දෙකක ය. එලෙස මාන රාශියක විරුද්ධාර්ථ ඇති සංකල්ප අපට සිතා ගත හැකි ය.

ඒ මාන කුමක් වුවත් ඒ විරුද්ධාර්ථ සියල්ල සංකල්ප වෙයි. පියා යන සංකල්පය ග්‍රහණය කිරමේ දී පුතා යන සංකල්පය මෙන් ම මව යන සංකල්පය ද වැදගත් වෙයි. එහෙත් අපට ප්‍රශ්න ඇති වන්නේ නිත්‍ය, ආත්ම, සසර වැනි සංකල්ප ග්‍රහණය කිරමේ දී ය. නිත්‍ය යන සංකල්පයට වෙනස්වීම යන සංකල්පය විරුද්ධාර්ථයක් ගෙන දෙයි. වෙනස් වීම යන්න සංකල්පයක් ලෙස ගත් කල මෙහි ප්‍රශ්නයක් නැත. එහෙත් සංකල්පයක් නො වන්නක් නිත්‍ය යන්නෙහි විරුද්ධාර්ථය ලෙස ගත හොත් එහි දී ප්‍රශ්න මතු වෙයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන්නෙන් කියැවෙන අනිත්‍ය, නිත්‍ය යන්නෙහි විරුද්ධාර්ථය ලෙස ගැනීම නිවැරදි නො වෙයි. එයට හේතුව එතැන අනිත්‍ය යන්න සංකල්පයක් නො වීම ය. අනිත්‍යය යනු වෙනස්වීම නො වන බව අප බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇත. අප සඳහන් කර ඇති පරිදි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන්නෙහි සඳහන් අනිත්‍යය වෙනස්වීම නම් ඒ අනිත්‍යය තේරුම් ගැනීම එතරම් අපහසු කරුණක් නො වන බැවින් බොහෝ දෙනා නිවන් අවබෝධ කර සිටිය යුතු ය.

නිවන ද සංකල්පයක් නො වන බැවින් ඒ සසරෙහි විරුද්ධාර්ථය දක්වන සංකල්පය නො වෙයි. සසරෙහි විරුද්ධාර්ථය අවශ්‍ය නම් සසර ගමන නැවතීම ලෙස ගත හැකි ය. සසර ගමන නැවතීම යන තේරුම්ගත් පමණින් අපට නිවන් අවබෝධ නො වෙයි. නිරක්ෂකයකුට එකිනෙකට සාපේක්ෂ ලෙස එකිනෙක අවබෝධ කර ගැනීම් වස් ගත හැක්කේ සංකල්ප ය. සංකල්පයක් තවත් සංකල්පයකට සාපේක්ෂ ව ගත හැකි නමුත් සංකල්පයක් නො වන්නක් එසේ නො ගත හැකි ය. සියලු සංකල්ප මිනිසුන් ගේ නිර්මාණ වෙයි. ඒ සම්මුතීන් වෙයි. ඒ සාපේක්ෂ වෙයි. පරමාර්ථ වූ ද, නිරපේක්ෂ වූ ද, මිනිසුන්ගේ නිර්මාණ නො වූ ද සංකල්ප නොතිබිය හැකි ය.

එසේ නම් නිවන, අනිත්‍ය ආදී වචනවලින් කියැවෙන්නේ මොනවා ද? ඒ මිනිසුන් විසින් නිර්මාණය කරන ලද දෙයක් හෝ ගුණයක් හෝ නො වෙයි. මේසය හෝ කන්ද හෝ මිනිසුන් විසින් නිර්මාණය කෙරුණු ඊනියා වස්තු දෙකක් ය. මේසය ද, කන්ද ද නිර්මාණය කෙර ඇත්තේ මිනිසුන් විසිනි. කන්ද, කන්දක් වනුයේ පංචේන්ද්‍රිය හා මනස සහිත මිනිසුන්ට ය, ඉනුදු සිංහල මිනිසුන්ට ය. ඉංග්‍රීසිකාරයාගේ හිල් (Hill)- හා මවුන්ටන් (Mountain)යන සංකල්ප කන්දට වඩා වෙනස් ය. අලියකු කන්ද ගැන සිතන්නේ කුමක් ද? අලි සිතන්නේ නැතැ යි කිව හැක්කේ නො සිතන්නකුට ය. අප විසින් යමක් නිර්මාණය කෙරෙන්නේ සංකල්පයක් ලෙස ය. කලින් සඳහන් කර ඇති පරිදි සංකල්පයක් සැම විට ම වචනයකින් ප්‍රකාශ කළ යුතු නො වෙයි.

ඒ ඒ මිනිසා අත්දකින ලෝකය ඒ ඒ මිනිසා විසින් නිර්මාණය කෙර ඇත. ඒ ඒ මිනිසාට තම තමන් ගේ ලෝක නිර්මාණය කිරම සඳහා ඒ ඒ අය ගේ සාංසාරික පුරුදු, සංස්කෘතිය හා මනස ද ඇතුළු ඉන්ද්‍රිය උපකාරී වෙයි. ඒ ඒ අය තමන් ගේ ලෝකය නිර්මාණය කර ගැනීමට පෙර ඇත්තේ කුමක් ද? වෙනත් වචනවලින් කියන්නේ නම් මා කන්දක් නිර්මාණය කරන්නේ කුමකින් ද? ඒ ප්‍රශ්නය වඩුවකු මේසයක් නිර්මාණය කරන්නේ කුමකින් ද යන ප්‍රශ්නයට

© Prof. Nalin De Silva

වඩා වෙනස් ය. වඩුවකු මේසයක් නිර්මාණය කරන්නේ ලීවලින් යැයි කීමට හැකි ය. එහෙත් මිනිසා මේසය යන සංකල්පය නිර්මාණය කරන්නේ එවැනි මූලද්‍රව්‍යයකින් නො වෙයි. මිනිසුන් ඒ ඒ දේ නිර්මාණය කරන්නේ ම ඔවුන්ට නිර්මාණය නො කර සිටීමට නොහැකි නිසා ය. මේසය හෝ කන්ද හෝ නිර්මාණය කරන මිනිසාට මේසයක් හෝ කන්දක් හෝ නොමැති බව නො තේරෙයි. මිනිසා නිර්මාණය කරන්නේ ඒ නොතේරුම්කම නිසා ය. මිනිසා නිර්මාණය කරන ලෝකය ඒ අයුරින් නැත. එය වෙනත් අයුරකින් ද නැත. ලෝකය ශූන්‍ය යැ යි බුදුන්වහන්සේ වදාරා ඇත්තේ එබැවින් ය.

ලෝකය ශූන්‍ය යැ යි බුදුන්වහන්සේ දේශනා කර ඇත්තේ මිනිසා විසින් නිර්මාණය කෙර ඇති සංස්කාර ශූන්‍ය වේ යන අර්ථයෙන් ය. සංස්කාර අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා ශූන්‍ය වෙයි. නැති යමක් ඇතැ යි ගත් විට ඒ ඇතැ යි කියන දෙය බොරුවක්, නැත්තක්, ශූන්‍යයක් වෙයි. අප විසින් සංස්කරණය කෙර ඇති සියලු සංකල්ප නැත. එනම් ඒ සියල්ල ශූන්‍ය වෙයි. ඒ සංස්කාර අනිත්‍ය වෙයි. ඒ අනාත්ම වෙයි. වෙනත් වචනවලින් කිව හොත් ඒ කිසිවකට වත් ස්වභාවයක් නැත. ඒ කිසිවක් ඊනියා යථාර්ථයක් නො වෙයි. කෙටියෙන් කියන්නේ නම් එහි කිසිත් නැත. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අවබෝධ කර ගැනීමට නොහැකි මිනිසා ඊනියා වස්තු නිර්මාණය කරයි. ඒවාට ස්වභාව ඇතැ යි සිතයි. එනම් ඒවාට ස්වභාව නිර්මාණය කරයි. එහි යථාර්ථයක් ඇතැ යි සිතයි. එනම් යථාර්ථයක් නිර්මාණය කරයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අවබෝධ කර තත් තැනැත්තා (එවිට තැනැත්තකු ද නැත) ඒ කිසිවක් නිර්මාණය නො කරයි.

එහෙත් ඉන් කියැවෙන්නේ රහතන්වහන්සේ යම් යම් සංකල්ප නිර්මාණය නො කරන බව නො වෙයි. සංකල්ප යනු දැනුම ය. බුදුන්වහන්සේ ද දැනුම නිර්මාණය කර ඇත. ඒ සත්ත්වයන් ගේ ප්‍රයෝජනය සඳහා ය. සත්ත්වයාට යමක් අවබෝධ කළ හැක්කේ එවැනි දැනුම් ඔස්සේ ය. ඊනියා ගිනි වළල්ලක් යැ යි අප පැවසුව ද එහි ගිනි වළල්ලක් නොමැති බව අපි දනිමු. ගිනි බෝලයක් කරකැවීමෙන් ගිනි වළල්ලක් සේ දෘශ්‍යමාන වන බව අපි දනිමු. එහෙත් අපි ප්‍රායෝගිකව ගිනි වළල්ලක් ගැන කියමු. අපි ගිනි වළල්ලක් නැති වුව ද ගිනි බෝලයක් ඇතැ යි සිතමු. බුදුන්වහන්සේ එතැන ගිනි බෝලයක් ද නැති බව දනිති. එහෙත් උන්වහන්සේ අපට උගන්වන විට ගිනි වළල්ල ගැන දේශනා කරන්නේ ගිනි බෝලය යන සංකල්පය යොදා ගනිමිනි. ඉන් කියැවෙන්නේ බුදුන්වහන්සේ ගිනි බෝලයක් ඇතැ යි ගත් බව නො වෙයි. බුදුන්වහන්සේ බුදු වුව ද දේශනා කර ඇත්තේ පෘථග්ජනයන්ට ය. එසේ දේශනා කිරමේ දී උන්වහන්සේට සංකල්ප භාවිත කිරමට සිදු විය.

ලෝකය, එනම් ලෝකය පිළිබඳ දැනුම, ශූන්‍ය වුව ද ඉන් කියැවෙන්නේ සංකල්ප ලෝකයෙන් "එපිට" ඊනියා යථාර්තයක් ඇති බව නො වෙයි. එසේත් නැත්නම් ඊනියා ශූන්‍යතාවක් ඇති බව ද නො වෙයි. අපේ ඉන්ද්‍රිය (මනස ද ඇතුළු) ලෝකයෙන් පිට කිසිවක් නැත. ඉන්ද්‍රිය ලෝකයේ ද, එනම් නිර්මාණය කෙරෙන ලෝකයේ ද කිසිවක් නැත. ඉන්ද්‍රිය ලෝකයෙන් පිටත නිර්මාණය කෙරුණු සංකල්ප ද නැත. නාගර්ජුනපාදයන්වහන්සේ කළ වරද ශූන්‍යතාවක් ඇතැ යි ගැනීම ය. සංකල්ප ඇතුළු දැනුම ශූන්‍ය යැ යි කීම එකකි. එහි ශූන්‍යතාවක් ඇතැ යි කීම තව එකකි. නාගර්ජුනපාදයන්වහන්සේ ගේ ශූන්‍යතාව ඊනියා යථාර්ථයක් විය.

ශූන්‍යතාව සාපේක්ෂ වන්නේ කුමකට ද? නාර්ජුනපාදයන්වහන්සේ ඒ ප්‍රශ්නයට පිළිතුරු නො දෙති. ථෙරවාදීන් ගේ ස්වභාවය යන්න පරාජය කිරීමට උත්සාහ ගත් නාගර්ජුනපාදයන්වහන්සේ කෙළවර වූයේ ශූන්‍යතාව නමින් ඊනියා නිරපේක්ෂකයක් නිර්මාණය කරමින් ය. ශූන්‍යතාව, ස්වභාවයටත් වඩා භයානක සංකල්පයකි. ශූන්‍යතාව ද සාපේක්ෂ ය. නාගර්ජුනපාදයන්වහන්සේ එසේ නොසිතුව ද ශූන්‍යතාවටත් විරුද්ධාර්ථයක් ඇත. එ බ්‍රහ්මන් ය. වඩා නිරවුල් ව සඳහන් කරන්නේ නම් අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් ය. අද්වෛත බ්‍රහ්මන් සියල්ල වෙයි. අද්වෛත බ්‍රහ්මන්ට දෙවැන්නකු නැත. ඒ බ්‍රහ්මන් සියල්ල නිසා ය. නාගර්ජුනපාදයන්වහන්සේ ගේ ශූන්‍යතා සංකල්පයට විරුද්ධාර්ථයක් අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් සංකල්පය ලෙස ඉන් අවුරුදු හාර සියයකට පමණ පසු නිර්මාණය විය. එහෙත් ඒ එලෙස විරුද්ධාර්ථයක් නිර්මාණය කළ යුතු ය යන අදහසින් නිර්මාණය කෙරුණක් නො වී ය.

මෙහි නිර්ගුණ් යන්නෙන් කියැවෙන්නේ ගුණයක් නැති බව ය. එනම් සංකල්පීය ව ගත් කල බ්‍රහ්මන්ට හොඳ නරක, සුදු කළු, උස මිටි. තරුණ මහලු, අඳුරු, එළිය ආදී වශයෙන් හෝ වෙනත් ආකාරයකට හෝ ගුණයක් නැත. ගුණ

© Prof. Nalin De Silva

නිර්මාණය වන්නේ බ්‍රහ්මන් නො දත් පෘථග්ජන පුද්ගලයන් අතිනි. පෘථග්ජනයෝ බ්‍රහ්මන් ගෙන් වෙන් වී ලෝකය නිර්මාණ කරති. පෘථග්ජන යන්නෙහි තේරුම ද වෙන් කිරම ය. වෙන් කරන්නේ, ගුණ අගුණ සහිත ලෝකයක් නිර්මාණය කර බ්‍රහ්මන් ගෙන් වෙන්වන්නේ පෘථග්ජනභාවය නිසා ය. මෙය ඇත්තට ම වෙන්වීමක් නො ව වෙන්වීමක් ලෙස පෙනෙන්නට පටන් ගැනීමකි. බ්‍රහ්මන් අද්වෛත බැවින් වෙන් කිරමට, බ්‍රහ්මන් ගෙන් වෙන් වූ දෙවැන්නක් නිර්මාණය කිරමට ඉඩක් නැත. වෙන් කිරම ද ගුණාගුණ නිර්මාණය කිරම ද මායාවක් පමණක් වෙයි.

අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් හා ශුන්‍යතාව අතර ඇති සාමානත්වය තේරුම් ගත යුතු ව ඇත. අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් පවතින මුත්, එනම් සත්භාවයෙන් යුක්ත නමුත් (Ontological)- එහි ගුණ නැත. ලෝකය වෙන් කර එහි අඳුර ආලෝකය ආදී ගුණ නිර්මාණය කෙරෙන්නේ පෘථග්ජනයන් අතිනි. ශුන්‍යතා දර්ශනයට අනුව සංකල්පීය වශයෙන් ඇති අඳුර ආලෝකය ආදී සාපේක්ෂ ගුණ නිර්මාණය කෙරෙන්නේ සත්ත්වයන් අතිනි. ඒ දර්ශනයෙහි අඳුර ආලෝකය ආදී වශයෙන් විරුද්ධාර්ථ ලෙස ඇති ගුණ සියල්ල නිර්මාණය කෙරුණු දැ වෙයි. එහි සසර හා නිවන ද එලෙස නිර්මාණය කෙරුණු දැ වෙයි. සසරෙහි නිවන ද නිවනෙහි සසර ද ඇත. නිවන ද සාපේක්ෂ වූ ද නිර්මාණය කරනු ලැබුවා වූ ද ධර්මයක් වෙයි. ඒ අරුතින් ගත් කල නිවන ද පෘථග්ජනයන් ගේ නිර්මාණයකි. ඇත්තේ ශුන්‍යතාව පමණ ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ශුන්‍යතාව පමණක් නිර්මාණයක් නො වේ යැ යි නාගර්ජුනපාදයෝ විශ්වාස කළ හ. ශුන්‍යතාව සත්භාවයෙන් යුක්ත බව ශුන්‍යතාවාදයෙන් ගම්‍ය වෙයි. නාගර්ජුනපාදයන්වහන්සේට අවුරුදු හාර සියයකට පමණ විසූ ශංකරාචාර්යයෝ ශුන්‍යතාවෙහි විරුද්ධ වූ අද්වෛත නිර්ගුණ බ්‍රහ්මන් නිර්මාණය කළ හ.

එහෙත් ශංකරාචාර්යයන් තමන් අද්වෛත නිර්ගුණ බ්‍රහ්මන් නිර්මාණය කළ බවක් කියා නැත. එතුමන්ට අනුව අද්වෛත නිර්ගුණ බ්‍රහ්මන් සත්භාවයෙන් යුක්ත ය. සත්භාවයෙන් යුත් එක ම ධර්මය ද අද්වෛත නිර්ගුණ බ්‍රහ්මන් වන බව එතුමා ගේ විශ්වාසය විය. එවැන්නක් නිර්මාණයක් යැ යි එතුමා කිසි දිනක නොකියනු ඇත. අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් හා ශුන්‍යතාව නිර්මාණ බවත් ඒ සංකල්ප දෙක එකිනෙකෙහි විරුද්ධාර්ථ බවත් පවසන්නේ අප ය. අද්වෛත බ්‍රහ්මන් සංකල්පය, පෘථග්ජනයන් විසින් කෙරෙන වෙන් කිරම ආදිය ඉතා පැරණි අද්වෛත වේදාන්ත දර්ශනයෙහි ද දැකිය හැකි ය. එහෙත් ඒ අද්වෛත බ්‍රහ්මන්ට ගුණ තිබුණි. ඒ අරුතින් ගත් කල අද්වෛත බ්‍රහ්මන් යනු නිරවුල් සංකල්පයක් නො වීය. ඒ සංකල්පය නිරවුල් සංකල්පයක් ලෙස ඉදිරිපත් කෙළේ ශංකරාචාර්යයන් ය. ඒ සඳහා එතුමන් ආභාසය ලැබුවේ ශුන්‍යතාවාදයෙන් ය. ඒ ආභාසය ඔස්සේ එතුමා අද්වෛත බ්‍රහ්මන්, අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් බවට පත් කෙළේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva